

# ජීවිතය දහමින් රැකගනිමු...

- දෙව්දත්ගේ අවසන් කාලය ගැන කථා වස්තුව
- ගාමිණී ජාතකය
- සෙනෙහෙබර ආමන්ත්‍රණය
- නිර්මාණ ඉසව්ව
- මිත්තානිසංස සූත්‍රය

ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව

උත්සාහයෙන් වීර්යයෙන්...
ජීවිතය ජයගන්නට වෙර දරනා...
පින්වන්ත දූ පුතුන් උදෙසා...

ශ්‍රී බුද්ධ වර්ෂ 2563 | ව්‍යවහාර වර්ෂ 2020
( මැයි, ජූනි, ජූලි, අගෝස්තු)

SCO
SHRADDHA CHARITY ORGANIZATION | www.sco.lk



මහා කාරුණික වූ ප්‍රඥාවෙන් අග්‍රේෂ්වර වූ සියලු දෙව් මිනිසුන් හට
විමුක්තියේ මාර්ගය විවර කළ ශ්‍රීමත් සුගත තථාගත ගෞතම සම්මා
සම්බුදු රජාණන් වහන්සේට අපගේ නමස්කාරය වේවා!



මහමෙව්නාව භාවනා අසපු සංචිතයේත්, ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේත්
නිර්මාතෘවර සහ ප්‍රධාන අනුශාසක
අතිපූජනීය කිරිබත්ගොඩ ඤාණානන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේ.

**ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව පුණ්‍ය ව්‍යාපෘතිය සඳහා**
**සෙනෙහසින් අවවාද අනුශාසනා කරමින් අප හට නිරතුරු මග පෙන්වන**
**අපගේ ගුරුදේවෝත්තම කල්‍යාණ මිත්‍ර**
**පින්වත් ලොකු ස්වාමීන් වහන්සේට අපගේ නමස්කාරය වේවා !**

ශ්‍රද්ධා රූපවාහිනිය
369, හේවාගම, කඩුවෙල.
දුරකථන : 0112 571 471
ෆැක්ස් : 0112 548 400
ඊ-මේල් : info@shraddha.lk
වෙබ් : www.shraddha.lk

මහමෙව්නාව භාවනා අසපුව

ශ්‍රද්ධා රූපවාහිනිය

ලක්විරු ගුවන්විදුලිය LAKVIRU RADIO

අනේක දුක් කම්කටොලු මැද
උපයාගත් මුදල් තුටු සිතින් ම
ජීවිතය ජය ගන්නට වෙර දරන
දැයේ දූ දරුවන්ට
මහත් සෙනෙහසින් දයාද කරන
දයාබර කැපකරු මව්පියවරුන් සියලු දෙනා ද
අනේක දුක් කම්කටොලු මැද
ගුණයෙන් නුවණින් පිරිපුන් අනාගතයකට
පෙරමං තනන ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී
පින්වත් දරුවන් සියලු දෙනා ද
නිදුක් වෙත්වා ! නීරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා !
දුර්ලභව ලද ගෞතම බුදු සසුන
නිමවන්නට මත්තෙන් ඉතා සුවසේ ම
උතුම් චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට
මේ දුක්ඛිත සසර ගමනින්
නිදහස් වීමේ වාසනාව ලබත්වා!

**නමෝ බුද්ධාය!**

ව්‍යවහාර වර්ෂ 2021 ක් වූ ජනවාරි මස 10 දින දී ය.

පින්වත් දූවේ පුතේ,

නොසිතූ විරූ අර්බුදයන්ට මුළු ලෝකය ම මුහුණපා සිටින කාල වකවානුවක් අප ගෙවා දමමින් සිටිනවා. කලින් කල නොයෙක් රෝග උවදුරු පැතිරී යාම නිසාවෙන් ලෝවැසියන් යම් යම් දුක්පීඩා වින්දා වුණත් ලෝකයේ අස්සක් මුල්ලක් නැර සියල්ලන් බොහෝ සෙයින් අසරණ බවට ඇද දැමූ මෙවැනි වාතාවරණයක් අපේ ජීවිත කාලය තුළ අත්දැක නැහැ. කොවිඩ් 19 වසංගතය සමස්ත ලෝකය ම කායික ව, මානසික ව වගේ ම සමාජයීය වශයෙනුත්, ආර්ථිකවත් බොහෝ පහතට ඇද දැම්මා. ඒ සියලු විපත්තීන් අතරේ නොනැවතී ම කාලය ගත වෙනවා. අප කවුරුත් වයසට යනවා.

ඒ ඒ කාලයේ දී සිදු කළ යුතු දේවල් ඒ කාලයනට සමගාමී ව සිදු කළේ නැති නම් එවැනි ජීවිත ගැන කිව හැක්කේ පසුබැසීමක් අත්දකින ජීවිත කියල යි. දූවේ, පුතේ ඔබට මේ ගෙවී යන කාලය වෙන් වී තිබෙන්නේ ඔබගේ ඉගෙනුම් කටයුතු වෙනුවෙන්. ජීවිතයේ හැමදාටමත් අප ඉගෙන ගන්නවා වුණත් අනාගතයේ තරුණ ප්‍රජාව ලෙස හා වැඩිහිටියන් ලෙස සමාජයට ඵලදායී වෘත්තිකයන් පිරිසක් බිහි කෙරෙන පදනම තිබෙන්නේ අද ඔබ ලබන මූලික අධ්‍යාපනය තුළ යි. ඕනෑම කෙනෙකුගේ ජීවිතයට මේ අධ්‍යාපන අත්දැකීම බොහොම වැදගත්. එනිසා, කවර බාධක පැමිණියත් ඔබේ අධ්‍යාපන කටයුතු මගහැර ගන්නට එපා.

සාමාන්‍යයෙන් අප බොහෝ දෙනෙකුට හුරු පුරුදු ගුරුවර වැඩිහිටියන් පසුපසින් ම සිටිමින්, නිතර උත්සාහවත් කරවමින් ශිල්ප ලබා දෙන ක්‍රමය යි. ඔවුන්ගේ ඇල්ම බැල්ම නැති වුණ හැටියේ කෙළි සෙල්ලමට ඇදෙන ස්වභාවයන් තමයි අපටත් ඔය වයසේ දී තිබුණේ. දැන් ඒ ඇල්ම බැල්ම ඔබට යම් ආකාරයකින් අහිමි වෙලා. තව කොපමණ කාලයක්, කවරාකාරයේ වෙනස්කම් එක්ක අපට මේ නුහුරු නුපුරුදු වටපිටාවේ හිඳින්න වේවි ද කියා කිව නොහැකියි. ඒ නිසා, දැන් කළ යුත්තේ අපට හුරු පුරුදු ස්වභාවයට සියල්ල පත් වන තුරු කල්මැරීම නොවෙයි; මේ පවතින වටපිටාවේ අත්නොහැර අපේ කටයුතු සිදු කරනා ආකාරයක් නිර්මාණය කර ගැනීම යි.

හොඳට ඉගෙන ගෙන, යහපත් පුරවැසියෙක් ලෙස මේ රටට, සමාජයට අර්ථවත් කාර්යභාරයක් සිදු කරන්නට ඔබ තුළ වූ අදිටන මේ කිසිවකින් වෙනස් නොවිය යුතුයි. අභියෝග හමුවේ පසුනොබැසීම ම ජීවිතවල දියුණුවට හේතු වන්නක්. මෙතෙක් ඉගෙන ගත් දෑ යළි යළිත් සිහිපත් කරමින්, නිතර පරිහරණය කරමින් ඒ ඒ විෂයෙහි ප්‍රවීණයන් වන්නට ඔබට හැකි යි. එපමණක් නොවෙයි; තරගකාරී විභාග රටාවන් හා අමතර පන්ති නිසාවෙන් ඔබට අහිමි වූ ස්වභාව ධර්මයේ ජීවිතය අත්විඳින කාලයක් බවට ද ඔබට මේ ගෙවී යන කාලය පත් කර ගන්නට පුළුවන්.

අධ්‍යාපන කටයුතු අතපසු නොකර ගන්න. ඔබේ නිවසේ මවගේ, පියාගේ කටයුතුවලට සහභාගී වී ඒ දේවල් ගැන යමක් කමක් ඉගෙන ගන්න. ඒ වගේ ම, ගහට වැලට සතා සීපාවාට සංවේදී වෙලා ඒවායේ සිදුවන අඛණ්ඩ වෙනස් වීම් ඔබේ ජීවිත අත්දැකීමක් බවට පත් කර ගන්න. අත්නොහැර

පින් දහම් කරන්න. වැඩිහිටියන්ට උපකාර කිරීම, සතා සීපාවාට මෙත් දයා පෙරදැරි ව උපකාර කිරීම තුළින් පවා ඔබට පින් රැස්කර ගන්නට පුළුවනි.

**ජීවිතයේ මුල් අවධිය බොහොම වටිනා ජීවිත පාඩමක්.**
**ඒ නිසා මේ කාලය අපතේ හරින්නට එපා...!**

**තෙරුවන් සරණයි!**

ගෞතම බුදු සසුන තුළ මෙත් සිතින්,
පූජ්‍ය අලුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ
ගරු අනුශාසක - ශ්‍රද්ධා මාධ්‍ය ජාලය

# පටුන


01. දෙව්දත්ගේ අවසන් කාලය ගැන කථා වස්තුව 12

02. සෙනෙහෙබර ආමන්ත්‍රණය 21

03. ගාමිණී ජාතකය 27

04. ජීවිතය දහමින් රැකගනිමු 34

05. නිර්මාණ ඉසව්ව 42

06. මිත්තානිසංස සූත්‍රය 61

අමා දම්රස වෑහෙන විස්තරාර්ථ

# ධම්ම පදය

**(යමක වර්ගය)**

**පූජ්‍යපාද කිරිබත්ගොඩ ඤාණානන්ද**
**ස්වාමීන්ද්‍රයන් වහන්සේ**



ආනන්තරිය පවක් සිදුවුණෝතින් ක්ෂණ සම්පත්තිය වැනැසී යනවා.

# දෙව්දත්ගේ අවසන් කාලය ගැන කථා වස්තුව

## "පව් කළ තැනැත්තා එනිසාම බොහෝ සේ තැවේ"

පින්වතුනේ, පින්වත් දරුවනේ, දෙව්දත් ගැන දැන් ඔබ සෑහෙන්න කරුණු දන්නවා. දේවදත්ත නම් අවාසනාවන්ත පුද්ගලයාගේ ජීවිතය පවින් පිරුණු හැටි සිතන කොටත් දුකයි. බුදුරජාණන් වහන්සේව මුණ ගැසිලත්, පැවිදි වෙලත්, චිත්ත සමාධිය දියුණු කරලත්, කොටින්ම ඉර්ධි ප්‍රාතිහාර්යය පවා කරන්න පුළුවන් මට්ටමට හැකියාවක් ලැබිලත්, ජීවිතය අවබෝධ කිරීමේ වාසනාව අහිමි කරගත්තා. තමන් තුළ තිබුණ සියලු කුසල් අහිමි කරගත්තා. දෙව්දත් වෛර බැඳගත් ආකාරය ඔබ කලින් ඉගෙන ගත්තා නේද? දේව්දත්ගේ ක්‍රෝධය හරිම අසාමාන්‍ය එකක්. හරිම විකෘති ආශාවක්. පළිගැනීමේ සීමාවක් නෑ. බුදුරජාණන් වහන්සේට විරුද්ධව කුමන්ත්‍රණය කරලා සෑහීමකට පත්වීමක් නැහැ. එයාගේ එකම සිහිනය වුණේ බුදුරජාණන් වහන්සේගේ විනාශය දැකීමමයි. කළුගල් පර්වතයක හිස ගසාගන්නා අන්ධයෙක් වගේ දෙව්දත් බුදුරජාණන් වහන්සේව විනාශ කරන්න මහන්සි ගත්තා.

එක්තරා අවස්ථාවක අජාසත් රජතුමාගේ හමුදා පිරිසෙන් තිස් දෙනෙක් පමණ ආයුධ සන්නද්ධ පිරිසක් බුදුරජාණන් වහන්සේව විනාශ කිරීම පිණිස පිටත් කෙරෙව්වා. ඒ හැමෝම බුදුරජාණන් වහන්සේ ඉදිරියේ මෙම කුමන්ත්‍රණය හෙළිදරව් කරලා පැවිදි වුණා. අජාසත් රජතුමාගේ ඇත් සේනාවේ අති

භයානක ඇතෙක් සිටියා. ඌ සුළු දෙයටත් කිපෙනවා. විශාල ඇතෙක්. නාලාගිරි කියලයි ඌට කිව්වේ. දේවදත්ත බුදුරජාණන් වහන්සේ පිඬු සිඟා වඩින වීදිය ගැන තොරතුරු සොයා ගත්තා.

එක දවසක් මේ නාලාගිරි ඇතාට ලොකු රා කළ ගෙඩි දහසයක් පෙව්වා. ඌ හොඳටම වෙරි වුණා. ඊට පස්සෙ ඇත් ගොව්වන් ලවා හෙණ්ඩුවෙන් ඇනලා ඇනලා මේ ඇතාව හොඳටම කුලප්පු කෙරෙව්වා. උගේ ඇස් රතු වුනා. කන් දෙක පළල් කර ගත්තා. නැට්ට ඔසවා ගත්තා. පොළොවේ පස් හාරන්න පටන් ගත්තා. කෝපයෙන් ගුගුරන්න පටන් ගත්තා. හොඬවැල ඔසවා ගත්තා. එක පිම්මට මහ පාරට පැන්නා. ගස් කොළන් උදුරලා විසි කළා. කඩපිල් කුඩුපට්ටම් කළා. මෙය දුටු මිනිසුන් සී සී කඩ දිව්වා. මහපාර එකම යුධ පිටියක් වුණා. ඉදිරියට පැමිණි මිනිසුන්ව කීතු කීතු කරලා දැම්මා. පිස්සෙක් වගේ එක පිම්මේ ඉස්සරහට දුවගෙන එනවා.

බුදුරජාණන් වහන්සේ ඒ මාවතේ ඇතාට මුහුණලා වැඩම කරනවා. පිටුපසින් වැඩිය ආනන්ද ස්වාමීන් වහන්සේට හොඳටම භය හිතුණා.

'අයියෝ... ඔන්න ඔන්න... භයානක ඇතෙක් පොළොව පෙරළගෙන එනවා. අනේ... මේ පැත්තටයි එන්නේ. හරි වැඩේ.... දැන් මොකද කරන්නේ? ඔව්... මේ ඇතා එන පිළිවෙළට නම්, මාගේ ශාස්තෘන් වහන්සේව මූට ගොදුරු වෙනවා. නැහැ.... නැහැ... එහෙම වෙන්න දෙන්න බැහැ. මට ඕන දෙයක් වුණාවේ. මං මගේ ජීවිතය ඇතාට පූජා කරනවා' කියලා ආනන්ද ස්වාමීන් වහන්සේ ඉදිරියට පැන්නා. බුදුරජාණන් වහන්සේ වහ වහා අනන්ද ස්වාමීන් වහන්සේව තමන් වහන්සේගේ පිටුපසට ගත්තා. මෛත්‍රී සිතින් යුතු බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් ඇතාට කතා කළා. දහම් දෙසුවා. ඇත්තෙන්ම මෛත්‍රියෙන් කැටි වූ ඒ සෑම වචනයක්ම ඇතාට

තේරුණා. උගේ වෛරී හිඳුණා. දරුණු ගති නැති වුණා. අහිංසක වුණා. ඇතා දමනය වුණා. ඉතාම හීලෑ ඇතෙක් බවට පත් වුනා. අන්තිමේදී මේ අසත්පුරුෂ දේවදත්තයා මේ විදිහට කල්පනා කළා.

'ඒ වැඩෙත් හරි ගියේ නැහැ නෙව. මං ශ්‍රමණ ගෞතමයන් වහන්සේව විනාශ කිරීමට හදන හදන උපක්‍රමය අසාර්ථක වෙනවා. අනුන්ට කියලා අනුන් ලවා මේක කරන්න බැහැ. හොඳම වැඩේ මගේ අතින්ම මෙයාව විනාශ කරන එකයි' කියලා.

දවසක් දේවදත්ත හොර රහසේම ගිජ්ඣකූට කන්ද මුදුනට නැග්ගා. ඒ කන්ද ලොකු කන්දක් නොවෙයි. පොඩි ගල් කන්දක්. කඳු මුදුනේ කුටි දෙකයි තියෙන්නෙ. ඉතින් එතැන පහළ ඇති සෙවණ තියෙන තැනක බුදුරජාණන් වහන්සේ සක්මන් කරමින් සිටියා. එදා දේවදත්ත ඒ කඳු මුදුනට නැග ගත්තා. එතැන විශාල ගලක් තිබුණා. දේවදත්ත හිමිහිට ඒ ගල සොලවලා පහලට පෙරළුවා. පහළ සක්මන් කරමින් සිටි බුදුරජාණන් වහන්සේගේ හිසට ඉලක්ක කොට පෙරළුවා. ගල වේගයෙන් පහළට වැටෙද්දී හරි පුදුමයි! ඒ කන්දෙන් තව ගලක් මතුවුණා. පහලට වැටෙන ගල ඒකෙ වැදුණා. වැදිලා වෙන පැත්තකට විසි වුනා. එහෙම විසිවෙද්දී ගැලවී ගිය ගල් පතුරක් බුදුරජාණන් වහන්සේගේ වම් සිරිපාදයේ මහපට ඇඟිල්ලේ වැදී ලේ ගලන්න පටන් ගත්තා. දේවදත්ත ඉක්මනින්ම හැංගුණා. බුදුරජුන්ගේ ලේ සෙළවීමේ ආනන්තරීය පාපකර්මය රැස් කරගත්තා. මේ අසත්පුරුෂ පුද්ගලයාට තවමත් පින් පව් තේරෙන්නේ නැහැ. තමන් අතින් සිදුවෙන මේ භයානක පාපකර්ම නිසා දුකට වැටෙන්නේ තමන්ය කියලා තවමත් තේරෙන්නේ නැහැ. තමන් අතින් කරන්නට ගිය ඒ ඝාතන සැලැස්මත් අසාර්ථක වුණා.

ඊළඟට මේ අසත්පුරුෂයා කල්පනා කළේ සංඝ පිරිස බිඳවන්නයි. සංඝභේද පාප කර්මය කරන්නයි. අන්තිමේදී කරුණු පහක් මුල් කරගෙන අලුත පැවිදි වූ පන්සියයක සංඝ පිරිසක් රවටා ගන්නට දේවදත්ත සමත් වුණා. අලුත පැවිදි වූ පන්සියයක් ස්වාමීන් වහන්සේලා හිතුවේ දේවදත්ත කල්‍යාණ මිත්‍රයෙක් කියලයි. ඔවුන් දේවදත්තට රැවටුණා. තමන් ළඟ හිටියොත් ඉක්මනින් නිවන් දකින මාර්ගය පෙන්වා දෙන්නම් කියලා ඒ භික්ෂූන් වහන්සේලා සියලු දෙනාම තමන්ට අවනත කරගන්නට දේවදත්තගේ මායාකාරී කතා බහට පුළුවන් වුණා. ඒ භික්ෂූන්ව අවනත කරගෙන ගයා ශීර්ෂයට පිටත් වුණා. එහි ගොස් ඒ පන්සියයක් භික්ෂූන් වහන්සේලාට බණ කියන්න පටන් ගත්තා. ඒ භික්ෂූන්ද මගඵල ලැබීමේ අදහසින් දෙව්දතුන්ගෙන් බණ අහනවා. නමුත් දේවදත්තගේ එකම අදහස ඔවුනට මගඵල ලබාදීම නොවෙයි. බුදුරජුන්ට විරුද්ධව ඔවුන්ව මෙහෙය වීමයි.

මෙය දැනගත් බුදුරජාණන් වහන්සේ සැරියුත් මුගලන් රහතන් වහන්සේලා අමතා වදාළා.

"සාරිපුත්ත, මොග්ගල්ලාන, ඔබ වහාම යන්න. ඒ අලුත පැවිදි වූ භික්ෂූන් කල්‍යාණ මිත්‍රයන් හඳුනා ගැනීමට අසමර්ථ වුණා. දේවදත්තගේ පව්ටු අදහස්වලට ඒ භික්ෂූන් ගොදුරු වෙන්න කලින් ඉක්මනින් බේරාගන්න."

සැරියුත් මුගලන් රහතන් වහන්සේලාද වහ වහා ගයා ශීර්ෂය බලා වැඩම කළා.

අධික මාන්නයකින් පෙළෙන, ප්‍රධානත්වය ලබා ගැනීමෙහි විකෘති ආශාවකින් පෙළෙන දේවදත්ත ඈතින් වඩින සැරියුත් මුගලන් රහතන් වහන්සේලා දැක, ප්‍රීතියෙන් කෑ ගැසුවා.

"පින්වත් මහණෙනි, අන්න බලව්. කවුද හරි? දැන් පැහැදිලියි. මමයි හරි. දැක්කා නේද මා කරා අග්‍ර ශ්‍රාවකයන්

වහන්සේලා එන ආකාරය? බුදු සසුන තියෙන්නේ කවුරු අතේද කියා දැන් මහණෙනි, නුඹලාට පේනවාද?"

සැරියුත් මුගලන් රහතන් වහන්සේලා ළං වන විට දේවදත්ත උන්වහන්සේලා අමතා මෙහෙම පැවසුවා.

"එම්බා සාරිපුත්ත, මෙහි එන්න. මගේ දකුණු පසෙන් වාඩිවෙන්න. එම්බා මොග්ගල්ලාන, මගේ වම්පසින් වාඩි වෙන්න. දැන් මේ සසුනේ නායකයා මමයි. සාරිපුත්ත... මොග්ගල්ලාන.... මා දැන් මෙතෙක් වේලා දහම් දෙසුවා. මගේ පිට ස්වල්පයක් රිදෙනවා. මා ටික වේලාවක් හාන්සි වී සිටින්නම්. මේ භික්ෂූන්ට ඔබ දහම් දෙසන්න."

දේවදත්ත හාන්සි වුණා. පවිටු සිත් ඇති සිහිනුවණින් තොර ඒ අසත්පුරුෂයාට එසැණින්ම හොඳටම නින්ද ගියා. ගොරව ගොරවා නිදාගත්තා.

සැරියුත් මහරහතන් වහන්සේ ධර්ම දේශනා කරද්දී, දේවදත්තට රැවටී සිටි අර අලුත පැවිදි වූ ස්වාමීන් වහන්සේලාට ඇත්ත අවබෝධ වුණා. සැබෑ කල්‍යාණ මිත්‍රයා කවුරුන්ද යන වග අවබෝධ වුණා. චතුරාර්ය සත්‍යයත් අවබෝධ වුණා. මුගලන් මහරහතන් වහන්සේ ඉර්ධි ප්‍රාතිහාර්ය දක්වමින් දහම් කරුණු පෙන්වා දුන්නා. ඒ පන්සීයක් භික්ෂූන් වහන්සේලාම සෝවාන් ඵලයට පත් වුණා. අන්තිමේදී ඒ සැරියුත් මුගලන් රහතන් වහන්සේලා ආපසු වඩින විට උන්වහන්සේලා පසුපසින් අර පන්සියයක් භික්ෂූන් වහන්සේලාම බුදුරජාණන් වහන්සේ ළඟට පිටත් වුණා.

දේවදත්ත වගේම ඔහුගේ යහළුවා වන කෝකාලිකත් පවිටු කෙනෙක්. ඔහු ඉදිරියට ඇවිත් බලද්දී කවුරුත් නෑ. හැමෝම සැරියුත් මුගලන් රහතන් වහන්සේලා සමඟ පිටත් වෙලා. කෝකාලිකට කේන්ති ගියා.

"මහලොකුවට කෑ ගහනවා. හැමෝම බේරාගන්න ඕන කියලා. ඔන්න අපිත් එක්ක ආපු පන්සිය දෙනත් අර සැරියුත් මුගලන් දෙන්නා ආපහු අරගෙන ගිහිල්ලා. මුන්දෑ තවමත් ගොරව ගොරවා බුදි" කියලා කෝකාලික දේවදත්තගේ පපුවට වැලමිටෙන් ඇන්නා. දේවදත්ත ඇහැරුණා. කලබලයට නැගිට්ටා. ඇස් ලොකු කරගෙන වටපිට බැලුවා. කවුරුවත් නැහැ. මේකත් වැරදුණා කියලා හිතද්දී කටින් උණු ලේ පිටවුණා. දේවදත්ත අසනීප වුණා. මාස නවයක්ම දුක් වින්දා. එන්න එන්නම අමාරුයි. තමන්ගේ අතින් සිදු වෙච්ච වැරදි එකින් එක චිත්‍රපටියක් වගේ තමන් ඉදිරියේ පේන්න පටන් ගත්තා. මෙතරම්ම විනාශකාරී විදිහට බුදුරජාණන් වහන්සේට විරුද්ධව කටයුතු කරද්දීත් උන්වහන්සේ ඒ කිසිවකට විරුද්ධව කිසිවක් නොකළ අයුරු මතක් වුණා. දේවදත්තට බුදුරජාණන් වහන්සේ දැකීමේ ආශාවක් උපන්නා.

"අනේ... මාව කොහොම හරි බුදුරජාණන් වහන්සේව දකින්න එක්කගෙන යන්න. මට මියයන්න කලින් උන්වහන්සේව දැකගත්තොත් ඇති."

දේවදත්තට උපස්ථාන කරපු පිරිස ඔහුව ඇඳක තබාගෙන සැවැත් නුවර බලා පිටත් වුණා. සැවැත් නුවර ජේතවනය බලා ගමන් කරද්දී අසල පොකුණක් දැක ඔහුට පිපාසයක් ඇතිවුණා. බලවත්ව පිපාසයක් ඇතිවුණා. ඒ වගේම ඇඟපත පුරා මහා දැවිල්ලක් හටගත්තා. ඔහුට පොකුණට බසින්නට ආශාවක් ඇතිවුණා. උපස්ථාන කරන පිරිස ඇඳ බිමින් තිබ්බා. දේවදත්ත අමාරුවෙන් වාඩිවෙලා හිටගත්තා විතරයි පොළොවෙන් ගිනිදැල් ඇවිත් දේවදත්ත වෙළාගත්තා. ඒ අවසන් මොහොතේ ජේතවනාරාමය දෙස බලා 'මම බුදුන් සරණ යමි'යි කියමින් පොළොවේ කිඳා බැස්සා. මේ සිදුවීම බුදුරජාණන් වහන්සේට සැළවීමෙන් පසු මෙම ගාථාව වදාළා.

**ඉධ තප්පති පෙච්ච තප්පති**
**- පාපකාරී උභයත්ථ තප්පති**
**පාපං මේ කතන්ති තප්පති**
**- භියෝ තප්පති දුග්ගතිං ගතෝ**

පව් රැස් කරනා මිනිසා - මෙලොව පසුතැවෙයි එනිසා
පරලොවදිත් පසුතැවෙමින් - දුකටම පත්වෙයි එනිසා
අයියෝ මම පව් කෙරුවා - කියමින් තැවෙනා මිනිසා
අපා දුකට වැටී පසුව - දැවෙයි තැවෙයි දුකින් යුතුව

පින්වතුනේ, පින්වත් දරුවනේ, මේ කෙලෙස්වල ස්වභාවය ඉතාමත්ම භයානකයි. දැන් බලන්න දේවදත්ත කියන්නේ කවුද? යශෝදරාවගේ සහෝදරයා. රාහුල කුමාරයාගේ මාමා. සිද්ධාර්ථ කුමාරයාගේ මස්සිනා. කොයිතරම් ළඟ ඥාතියෙක්ද? යශෝදරා දේවිය රහත් භික්ෂුණියක් බවට පත්වුණා. රාහුල කුමාරයා රහතන් වහන්සේ නමක් බවට පත්වුණා. මේ මහා භද්‍ර කල්පයේ හතරවෙනි බුදුරජාණන් වහන්සේ ලෙස සම්බුද්ධත්වය ලබා ගන්නට සිද්ධාර්ථ කුමාරයාට පුළුවන් වුණා. නමුත් දේවදත්ත විකෘති ආශාව නිසාම, මාන්නය නිසාම, බද්ධ වෛරය නිසාම, ක්‍රෝධ කිරීම නිසාම, පළිගැනීම නිසාම, ප්‍රධානත්වයට ඇති ආශාව නිසාම අවීචි මහා නරකාදියෙහි ඉපදෙන විදිහට කර්ම රැස්කරගත්තා. අනන්තරීය පාප කර්ම කරගත්තා. දැන් දේවදත්ත කල්පයක් පුරාවට ඒ නරකාදියේ මොහොතකවත් සුවයකින් තොරව දුක් විඳිනවා.

පින්වතුනේ, පින්වත් දරුවනේ, ආනන්තරීය පාපකර්ම පහක් තියෙනවා. මේවාට ආනන්තරීය පාපකර්ම කියල කියන්නේ, මරණයෙන් පසු වෙන කොහේවත් අතරක උපත නොලබා කෙළින්ම අවීචි මහා නරකාදියෙහි උපදින නිසයි. ඒ ආනන්තරීය පාප කර්ම පහ මොනවාද?

- තමන්ගේ මව් ඝාතනයට පත් කිරීම.
- තමන්ගේ පියා ඝාතනයට පත් කිරීම.
- රහතන් වහන්සේ නමක් ඝාතනයට පත් කිරීම.
- බුදුරජාණන් වහන්සේගේ ශරීරයෙහි රුධිරය ගලන අයුරින් ද්වේෂ සහගත ලෙස තුවාල කිරීම.
- සමඟිව සිටින සංඝයා භේද කොට තම පක්ෂයට ගැනීම.

චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කළ කෙනෙක් මේ පව්වලින් සදහටම නිදහස් වෙනවා. මේ පව්වලට මූලික හේතුව වන්නේ අසත්පුරුෂකමත්, කෙළෙහි ගුණ නොදන්නාකමත් බලපවත්වන පෘථග්ජන ජීවිතයයි. ඒ කියන්නේ කෙනෙක් සෝවාන් වීම පිණිසවත් මාර්ගය ප්‍රගුණ කරන්නේ නැතිනම් මේ අනතුරට මුහුණ දෙන්න ඉඩ තියෙනවා. මේ ජීවිතයේ මෙවැනි පව් නොකළත්, වෙන ජීවිතයක වුණත් තමා අතින් මෙවැනි දෙයක් සිදු වෙන්න ඉඩ තියෙනවා. මේ නිසා අපට තිබෙන එකම රැකවරණය නම් මේ ගෞතම බුද්ධ ශාසනය තුළදීම චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කරගැනීමමයි. සමහරුන් කියාවි ඕවා කොහොම කරන්නද? පාරමී පුරන්න ඕන නොවෙද? ඔය කියන පමණින් මගඵල ලබන්නෙ කවුද? කියලා. නමුත් සෝවාන් ආදී මාර්ගඵල ලැබීම පිණිස පාරමී පිරිය යුතුයි කියලා බුදුරජාණන් වහන්සේ කාටවත් දේශනා කරලා නැහැ. උන්වහන්සේ වදාළේ සත්පුරුෂ ආශ්‍රයෙන් චතුරාර්ය සත්‍යය ධර්මය අසන්නට ලැබෙනවා නම්, යෝනිසෝ මනසිකාරයෙන් ධර්මයෙහි හැසිරෙනවා නම් ඔහුට මගඵල ලබන්නට පුළුවන් බවයි. එනිසා අහංකාර හිස් මිනිසුන්ගේ ප්‍රලාප නොවෙයි අපට වැදගත් වන්නේ. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයයි.



# සෙනෙහෙබර ආමන්ත්‍රණය

# ආදරණීය දුවේ... පුතේ...

ජීවිතය යහපත් කරගැනීමට, සුන්දර කර ගැනීමට ඔබ දරන උත්සාහයට මහත් අස්වැසිල්ලක් ගෙන දෙන දයාබර කැපකරු දෙමාපියන් ඔබ වෙනුවෙන් එවූ තවත් සටහනක්...

*නමෝ බුද්ධාය!*

*ආදරණීය ජනිත් පුතා,*

*ජනිත් පුතා මා හට එවූ ලිපිය ලැබුණා. මම දිගටම ඔබේ ශිෂ්‍යාධාර මුදල් වෙලාවට එවන බැවින් පුතාට එය වෙලාවට ලබාගත හැකිය. පන්ති ගාස්තු වෙලාවට ගෙවා පාසල් කටයුතු හොඳින් කරන්න. කොතරම් බාධක තිබුණත් අධ්‍යාපන කටයුතු නවත්වන්න එපා. පුතාට අධ්‍යාපන කටයුතු හොඳින් 2021 කරන්න මම පාසල් පොත් ලැයිස්තුවේ අයිතම එවනවා. සියලු දේ ඉතා පරිස්සමින්, උපරිම ප්‍රයෝජනයට ගනිමින් පාවිච්චි කරන්න.*

*ඔයාගේ මල්ලිගේ වකුගඩු අසනීප තත්වය දැන් හොඳයි ද? මල්ලිට ඉක්මණින් සුවවේවා! කියා ප්‍රාර්ථනා කරනවා. Covid වසංගතය සමග ඔබගේ දෙමාපියන්ට මෙන් ම අපට ද බාධක තියෙනවා. හැබැයි පාඩම් කටයුතු මග හරින්න එපා. මොකද? ගෙවල්, සල්ලි, බඩු යන හැමදේම නැතිවෙන දේවල්. ඔයා හොඳට ඉගෙන ගෙන ඔයාගෙ බලාපොරොත්තුව අනුව වෛද්‍යවරයෙක් වුණ දැනුම, කවදාවත් කාටවත් ගන්න බෑ. ඔයාගේ දැනුම, අවබෝධය, අනිත් දේවල් වගේ නැතිවෙන්නෙ නෑ. ඒ නිසා හොඳට පාඩම් කරන්න. ඔයාගෙ ඊළඟ ලිපියේ මට ඔයාගේ 2020 පාසල් ප්‍රගති වාර්තාවේ ඡායා පිටපතක් එවන්න. මම කැමති දැනගන්න 2020 වාර විභාගයේ ලකුණු.*

*ජනිත් පුතා ඇතුළු පවුලේ සැමට නිදුක් නිරෝගී වාසනාවන්ත සුභ නව වසරක් ප්‍රාර්ථනා කරනවා...*

*තෙරුවන් සරණයි!*

*මීට කැපකරු මව....*

Dearest Shayani,

Hope this Letter finds you well. I am very honored to lend a helping hand to a clever and determined girl like you. I am deeply touched with your appreciation but the biggest reward will be to see how high you will achieve in another few years' time.

I hope you continue to use this scholarship fund wisely for your education and make the best use of this opportunity given the you yes we all are suffering in many different ways during this hard times, but you should not let your studies get interrupted.

I am sending you school items for your new school year 2021 which is listed in next page. hope you like them and make good use of them all. Next year, I will send you shoes as well, so remember to let me know your shoe size at the end of the year.

I can read and write very well in Sinhala but I will write to you in English so it will help you to learn this language and get better at it that is how I learnt English too, by reading and writing. I wish you all the very best for the coming year and hope you will do well in your studies. May the blessings of the noble triple gem be with you.

Wish you all the best.

Ms. Waruni

# ආදරණීය අම්මේ... තාත්තේ...

මේ ඔබෙන් ලද මහඟු දායාදයට කෘතගුණ එක්වූ තවත් සෙනෙහෙවන්ත සටහන්...

*නමෝ බුද්ධාය!*

*කැපකරු දෙමාපියන් වෙත,*

*පළමුව ඔබේ සැපදුක් දැනගැනීමට කැමතියි. මා සිතනවා ඔබ කිසිදු කරදරයකට පත් නොවී සුවසේ ජීවත් වෙතැයි කියා. මේ ලිපිය මා ලියන්නේ වසර 05ක් පමණ මා වෙත ශිෂ්‍යාධාර මුදල් පිරිනැමූ දයාබර ඔබට කෘතගුණ දැක්වීමටයි. මේ කාර්යයට සැමදා ඔබත් සමඟ සිට ආශිර්වාද කරන්නා වූ පින්වත් ලොකු ස්වාමීන් වහන්සේටත්, අළුදෙණියේ සුබෝධි ස්වාමීන් වහන්සේ ඇතුළු ශ්‍රද්ධා සමාජ සත්කාර අංශයේ සියලු දෙනාටත් කෘතඥතාව පළකිරීමට ද මෙම ලිපියෙන් මම අදහස් කරමි.*

*මා 09 වසරේ අධ්‍යපන කටයුතු සිදු කරමින් සිටි අවදියේ පටන් මේ දක්වා මාසිකව පින්වත් ඔබ විසින් වෙහෙස මහන්සි වී උපයා ගන්නා මුදලින් කොටසක් මා වෙත ලබාදීම, මා සිතන්නේ පෙර අත් භවයක දී ඉගෙන ගැනීමට උනන්දු වන නමුත් අඩු ආදායම්ලාභී පවුල් වලට මා උදව් කළ නිසා මට ලැබුණු ප්‍රතිලාභයක් ලෙස ය.*

*මෙම කාලය පුරා ම අපට මුදල් ලබා දී ඔබ නිකරුනේ බලා සිටියේ නැත. මේ ශිෂ්‍යත්ව ව්‍යාපෘතියෙන් මුදල් අරපිරිමැස්මෙන් වියදම් කළ යුතු ආකාරය, පින් දහම් කිරීමට පුරුදු කිරීම ආදී ගුණාංග මා තුළ වර්ධනය කර ගැනීමට හැකිවිය. එනිසා ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය වෙනත් ශිෂ්‍යත්ව ව්‍යාපෘති මෙන් නොවන බව වටහා ගත හැකිය.*

පොත් කියවීමේ වැදගත්කම අන් අයට උදව් කිරීමෙන් ලැබෙන ආනිශංස මේ හරහා දැන ගැනීමට හැකිවිය.

පෙර ලිපිවලදී ඔබට ප්‍රගතිවාර්ථා සටහන්වල ඡායාරූප පිටපත් මට එවීමට හැකි වුවත් මෙවර මට එය කිරීමට නොහැකි වේ. ඊට හේතුව කොරෝනා වංසගතය නිසා අපට මාස ගණනක් පාසල් යාමට නොහැකි වූ නිසා වාර පරීක්ෂණ නොපැවැත් වූ බැවිනි.

අ.පො.ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල නිකුත් වූ විගස ඒ පිළිබඳව ඔබව දැනුවත් කිරීමට මම කටයුතු කරමි. ඉතින් දයාබර දෙමාපියනි, නැවත ලිපියකින් ඉක්මණින් ඇමතීමට මම බලාපොරොත්තු වෙමි. ඉක්මණින් සසර ගමන කෙටි කර ගැනීමට ඔබට ශක්තිය, ධෛර්යය, වාසනාව උදා වේවා! යි මම ප්‍රාර්ථනා කරමි.

දළඳා සමිඳු පිහිටයි...!

මීට කැපකරු පුතණුවන්...

නමෝ බුද්ධාය!

දයාබර කැපකරු අම්මේ තාත්තේ,

ඔබ සැමගේ සැප දුක් කෙසේ ද? නිදුක් නිරෝගී සුවෙන් ඇතැයි සිතමි. ඔබ හට ලිපිය එවීමට ප්‍රමාද වූ බැවින් ඒ සඳහා සමාව අයදිමි. බාධා මැදින් මාගේ අරමුණ කරා පිය නඟින්නට මට සහය වන ඔබ සැමට දහස් වාරයක් ස්තූතිවන්ත වෙමි. ආදරණීය කැපකරු අම්මේ තාත්තේ, ඔබගේ කරුණාබර පරිත්‍යාගයට උපරිම සාධාරණයක් ඉටු කිරීමට මම හැම විට ම කැපවී අධ්‍යාපන කටයුතුවල නිරත වෙමි. නැණ මෙන් ම ගුණධර්මවලින් ද පිරිපුන්ව ඉදිරියට පියමනින්නට දෙමව්පියන් මෙන් ම ඔබත් සැම විට ම ශක්තියක් වෙයි. මාගේ කුඩා කල සිට ම සරල දිවියකට හුරු වීමට මම කටයුතු කරමි. හැකි සෑම විටම දහම් පුස්ථකයක් කියවීමටත් එයින් යමක් ජීවිතයට එකතු කර ගැනීමටත් මා දැන් හුරු වී ඇත. එම හුරුවේ මූලාරම්භය සදහම් පුස්ථකය යි. පින්වත් ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු පිරිස ලබා දෙන එම පොත අගනා ධර්ම දානයකි. මෙවර පොත ද ඉතා ආශාවෙන් කියව්වෙමි. මාගේ මව එම පොත් කියවීමට විශාල කැමැත්තක් දක්වයි. උත්සාහය, කැපවීම, ධෛර්යය පෙරදැරිව තම යහපත් අරමුණු කරා නොබියව පැමිණිය යුතු බව එම පුස්ථකවලින් මම උගත්තෙමි.

ඔබගේ පරිත්‍යාග මුදල සෑම මසක ම එක් විෂයක් සඳහා අමතර පන්ති ගාස්තු ගෙවීමට ලබා ගනිමි. කොරෝනා වසංගත සමයේ ගත් මුදලින් පින්වත් මෑණියන් වහන්සේ නමකට අදනකඩයක් හා පාවහන් යුගලක් පූජා කළෙමි. දයාබර ඔබ සැමද සිහිකොට පුණ්‍යානුමෝදනා කළෙමි. මා වැනි දරුවන් හට පිහිටවන ඔබ සැම මේ මිහිපිට සිටින සැබෑ මනුෂ්‍යයන් ය. කෙදිනක හෝ මමත් ඔබ මෙන් ශ්‍රද්ධා මාධ්‍ය ජාලයේ කැපකරු මවක් වී තවත් දරු කැළකට දිරිය දෙමි.

ඔබ සැමට තුනුරුවන්ගේ ආශිර්වාදය ලැබී නිදුක් නීරෝගී සම්පත්තිය වැඩි වේවා!යි පතමි..!

මීට කැපකරු දියණිය...

# ගාමිණී ජාතකය

## ගාමිණී නමැති තරුණ කුමාරයෙකුගේ කතාව

පින්වතුනේ, පින්වත් දරුවනේ,

සිත වට්ටා නොගෙන උත්සාහය ඇති කරගැනීම ජීවිතයේ දියුණුවට ඉතාම අවශ්‍ය අංගයක්. බොහෝ දෙනෙක් ඉක්මනින් සිත වට්ටගන්නවා. අනේ මට මෙය කරන්ට අමාරුයි කියා උත්සාහය අත්හරිනවා. ඒ නිසා ම තමන්ගේ දියුණුව වළකිනවා.

බුද්ධ කාලයේත් සැවැත් නුවර සිටිය එක්තරා තරුණයෙක් නිතර නිතර බණ අසන්නට දෙව්රමට ගියා. ඔහුගේ සිතටත් පැවිදි වීමේ ආශාව ඇති වුනා. ඉතා වෙහෙසී මාපියන්ගෙන් අවසර ගත්තා. ගෞතම බුදු සසුනේ පැවිදි වුනා. මොහු පැවිදි වුනේ මහත් බලාපොරොත්තුවක් සිතේ තියාගෙනයි.

"මාත් ඉක්මනින් හුදෙකලා වෙනවා. එතකොට රුක් සෙවනේ, ගිරි ගුහාවල, ලස්සන දිය ඇලි අසල මටත් භාවනා කරන්ට පුළුවනි. ධ්‍යාන උපදවාගන්ට පුළුවනි. මටත් මගඵල පසක් කරන්ට පුළුවනි" කියලා මහා සුන්දර සිහිනයක පැටලුනා.

මේ භික්ෂුව ඉතා ඕනෑකමින් ධර්මය ඉගෙන ගත්තා. අනිත් භික්ෂූන් සමඟ ඉතා සතුටින් හුදෙකලා වාසයට පිටත් වුනා. ඉතා සැදැහැවත් පිරිසක් ඔවුන්ට කුටි සෙනසුන් හදලා දුන්නා. මේ භික්ෂුවත් එහි කුටියක තනි වුනා. තනියම සක්මන් කළා. භාවනා කළා. භාවනාව පටන් ගත් විට එක්කෝ නින්ද යනවා. එහෙමත් නැත්නම් සිත බාහිර අරමුණු වල විසිරෙනවා. නොයෙක් මනස්ගාත වල සිත පැටලි පැටලී යනවා. තමා සිතූ තරම් වැඩේ ලේසි නැහැ. ටික කලක් යද්දී මේ භික්ෂුවට භාවනාව එපා වුනා. හුදෙකලා වාසයත් එපා වුනා. සතිපට්ඨානය වැඩීමත් එපා වුනා. ආපසු ජේතවනයට ම වැඩියා. සාමාන්‍ය විදිහට අතුපතු ගාගෙන ජීවත් වුනා.

"ඇවත, ඔබ ගොඩාක් ආසාවෙන් නේද ඈත අරණ්‍යයට ගියේ. නමුත් ගිය වැඩේ හරි ගියේ නෑ වගෙයි. මොකද වුනේ?"

"අනේ ඇවැත්නි... මාත් උත්සාහ කළා. මට මේ භාවනාව කරගන්ට බැහැ නොවැ. ඉතිං මං මේ වැඩේ අත්හැරියා. මං නිකං මොකටෙයි බර වැඩ කරන්ට යන්නෙ?"

"හා... හා.... එහෙම කියන්ට එපා ඇවත. ඕනෑම දෙයක් පටන් ගනිද්දී අමාරු තමයි. පටන් ගනිද්දී ඕනෑම දෙයක් වරදින්ට පුළුවනි. ඒකෙන්ම යි ඔහු නැවත හරියට කරන්ට ඉගෙන ගන්නේ... අනික භාග්‍යවතුන් වහන්සේ භික්ෂුවක ගේ වීර්යය ගැන මොනතරම් ප්‍රශංසා කරනවාද... හා... එහෙනම්... ඉතිං අපි යමු භාග්‍යවතුන් වහන්සේ ළඟට.... උන්වහන්සේට මේක අපි දැනුම් දෙමු."

ඉතින් අනිත් භික්ෂූන් වහන්සේලා අර උකටලී භික්ෂුව නොකැමතිව සිටියදී ම භාග්‍යවතුන් වහන්සේ වෙත කැඳවාගෙන ගියා.

"භික්ෂුව.... ඇයි ඔබ වීර්යය අත්හැරියේ...? සතිපට්ඨානය පිණිස උත්සාහ නොගන්නේ මන්ද?"

"අනේ ස්වාමීනී... භාග්‍යවතුන් වහන්ස, මං ගොඩාක් උත්සාහ කළා. දැන් මගේ හිසත් රිදෙනවා. ඇඟපතත් රිදෙනවා. භාවනා කරනවා යන කරුණ සිතන්ටත් අමාරුයි.

"භික්ෂුව... ඔබ මේ ආත්මෙ තමයි ඔවැනි සුළු කරුණකට තමන්ට ලැබෙන මහත් ලාභයක් අත්හැර දමා ඉන්නෙ. නමුත් පෙර ආත්මෙක ඔබ මොනතරම් ප්‍රඥාවන්තව මොනතරම් උත්සාහයකින් කටයුතු කළාද...? ඒ කාලේ ඔබ බරණැස රජ්ජුරුවන් ගේ බාල පුත් කුමාරයා. ඔබට වැඩිමහල්

සහෝදර කුමාරවරු සියයක් හිටියා. ඒ හැමෝම පරදවා ඔබ එදා රජවුනා නොවැ.... මෙදා මොකද මේ....?"

එතකොට එතැන සිටිය භික්ෂූන් වහන්සේලා භාග්‍යවතුන් වහන්සේට මෙහෙම ආයාචනා කළා.

"ස්වාමීනී.... භාග්‍යවතුන් වහන්ස, දැන් මේ උත්සාහ අත්හැරලා දාපු මේ භික්ෂුව ගේ කථාව අපි කවුරුත් දන්නවා. නමුත් භාග්‍යවතුන් වහන්සේ වදාළ ඒ රාජකුමාරයා ගේ කතාන්දරේ අපි දන්නෙ නෑ. අනේ අපට අපි කවුරුත් මෙතෙක් නොදන්නා මොහුගේ පෙර ආත්මයේ උත්සාහය ගැන කථාව වදාරණ සේක්වා!"

"මහණෙනි... ඒක වුනේ මෙහෙමයි. ඕන්න ගොඩාක් ඉස්සර කාලෙක බරණැස් පුරේ බ්‍රහ්මදත්ත නමින් රජෙක් වාසය කළා. මේ රජ්ජුරුවන්ට පුත් කුමාරුවරු සිය දෙනෙක් හිටියා. අන්තිමට උපන් පුත් කුමාරයාගේ නම ගාමිණී.

ඒ කාලයේ බෝධිසත්වයෝ තක්සිලාවේ ආචාර්යවරයෙක් වෙලා හිටියා. ගාමිණී කුමාරයා ඉගෙන ගත්තේ ඒ බෝසත් ආචාර්යවරයා ළඟයි. අනිත් කුමාරුවරු වෙනත් ආචාර්යවරු ළඟ ශිල්ප හැදෑරුවා. ගාමිණී කුමාරයා සිය ආචාරයවරයාට මෙහෙම කිව්වා.

"ආචාර්යපාදයෙනි.... මට වැඩිමහලු කුමාරවරු සිය දෙනෙක් ඉන්නවා. මට රජකම ලැබෙනවා තබා ඒ ගැන සිතාගැනීමත් අමාරුයි."

"කුමාරය... එහෙම කියන්න එපා. නුවණැත්තන් ගේ අවවාදයේ පිහිටා කටයුතු කළොත්, ආවේගයකට පත් නොවී, උපායශීලීව කටයුතු කරන්නට දක්ෂ වුනොත් තමන් කැමති දේ ලබන්නට පුළුවන්කම තියෙනවා. දානය, ප්‍රිය වචනය,

අර්ථචර්යාව, සමානාත්මතාව යන මේ සතර සංග්‍රහ වස්තුවෙන් අන්‍යයන්ට සලකන්ට ඔබ දක්ෂ වුවහොත් රජකම වුනත් ඔබට වැඩි ඈතක තියෙන දෙයක් නොවේ.”

ඉතින් බෝසත් ආචාර්යවරයාගේ උපදෙස් පරිදි ගාමිණී කුමාරයා කටයුතු කළා. ශිල්ප ඉගෙනගත් අනිත් කුමාරවරු පියරජු බැහැදකින්ට ගියා. ගිහින් පියරජුගෙන් ජනපදය බැගින් ඉල්ලාගෙන ඒවායේ පාලකයෝ බවට පත්වුනා. වැඩිමහල් කුමාරවරු බාල කුමාරයා ඇමතුවා.

“මලණ්ඩ, දැන් අපි හැමෝට ම පියරජතුමා ගෙන් ජනපදය බැගින් ලැබුනා. ඔබත් පියරජු බැහැදැක පාලනය කිරීමට ජනපදයක් ඉල්ලා ගන්න.”

එතකොට ගාමිණී කුමාරයා නිශ්ශබ්ද වුනා. තම ආචාර්යවරයාට මේ බව දැනුම් දුන්නා. එතකොට ආචාර්යවරයා කුමාරයාට උපදෙස් දුන්නා.

“කුමාරය... ඔබ ජනපද ඉල්ලාගෙන යන්ට එපා. පිය රජු සමීපයේ ම වාසය කරන්න. මහජනතාවට සතර සංග්‍රහ වස්තුවෙන් සලකන්න. වෙළෙන්දන්ගේ සිත් දිනා ගන්න. අන්තඃපුරවාසීන්ගේ සිත් දිනාගන්න. හැමෝට ම ආදරෙන් සළකන්න.”

ඉතින් ගාමිණී කුමාරයා ආචාර්යවරයා ගේ බසට අවනත වුනා. කලබලේට ජනපදයක් ඉල්ලා ගෙන ගියේ නෑ. රාජ මාළිගාවේ ඉඳගෙන ම හැමෝට ම උපකාරීව වාසය කළා.

මහරජ්ජුරුවෝ මරණ මංචකයට වැටුනා. ඔහු ඇමැතිවරු කැඳෙව්වා.

"ඇමතිවරුනි... මගේ පුත් කුමාරවරුන්ට පණිවුඩ යවන්න. පියරජුට දැන් අසාධ්‍යයි කියන්න"

"දේවයන් වහන්ස... අපි දැනගන්නට කැමැතියි.... ඔබවහන්සේ ගේ ඇවෑමෙන් රජකම හිමිවිය යුත්තේ කාටද?"

"ඇමතිවරුනි,..... කොහෙත් රජකම ලැබෙන්නේ වැඩිමහල් පුත්‍රයාට තමයි. නමුත් මට හිතෙන්නේ මගෙන් පස්සේ රජකම ලැබිය යුත්තේ මගේ බාල පුත්‍රයාට කියලයි. ගාමිණී කුමාරයාටයි. ගාමිණී කුමාරයාට රජකම ලැබීම ගැන ඔබේ අසතුටක් තියෙනවාද?"

"දේවයන් වහන්ස.... අපිත් මේ සිත සිතා සිටියේ මෙකරුණ තමයි. ගාමිණී කුමාරයා රජකමට හැම අතින්ම සුදුසුයි. මේ ඇමතිවරුත් රටවැසියොත් හැමෝම ගාමිණී කුමාරයට කැමතියි."

ඉතින් රජතුමාගේ ඇවෑමෙන් පස්සෙ ගාමිණී කුමාරයා රජ වුනා. වැඩිමහල් සහෝදර කුමාරවරුන්ට වස්තුව බෙදා දුන්නා. ඔවුන් හැමෝට ම බාල කුමාරයා රජකම ලැබීම ගැන සතුටු වීම හැර වෙන කිසිම දෙයක් කළ හැකිව තිබුනේ නෑ. දවසක් ගාමිණී රජතුමා සිංහාසනයේ සිටිමින් මෙහෙම ප්‍රීතිවාක්‍ය ප්‍රකාශ කළා.

"නුවණැත්තන් ගේ අවවාද අනුව කටයුතු කරනවා නම් ඔහුට කවරදාකවත් වරදින්නේ නෑ. ඔහුට තමා ප්‍රාර්ථනා කරන දේ ලබාගන්නට පුළුවනි. ගාමිණී.... නුඹටත් මේ සියල්ල ලැබුනේ ආචාර්යවරයා ගේ දක්ෂ උපදෙස් නිසයි. ඒ නිසා ගාමිණී.... වැඩිමහල් සහෝදරවරු සියයක් පරදවා රජවුනේ

නුඹේ ආචාර්යවරයා නිසාමයි. නුඹේ ආචාර්යවරයා ම යි මෙහි සැබෑම හිමිකාරයා...." කියමින් සතුටු වුනා. බෝසත් ආචාර්යවරයාගේ උපදෙස් පරිදි ගාමිණී රජු ඉතාම ධාර්මිකව රජ කළා.

මහණෙනි.... ඒ කාලෙ ගාමිණී රජ්ජුරුවන් වෙලා හිටියේ මේ භික්ෂුව. ගාමිණී කුමාරයාට රජකමට පාර කියූ ආචාර්යවරයා වූයේ මම යි. දැන් මේ ආත්මේ මං නිවනට පාර කියනවා. දැන් භික්ෂුව ඔබ එදා වගේ ම සිතට ධෛර්යය ගෙන කලබල නොවී ඉවසීමෙන් සිහි නුවණ වඩන්න."

ඉතින් භාග්‍යවතුන් වහන්සේ ඒ භික්ෂුවට චතුරාර්ය සත්‍යය ධර්මය දේශනා කළා. ඒ දේශනාවේ කෙළවර එතෙක් උකටලීව සිටි භික්ෂුව උතුම් අර්හත්වයට පත්වුනා.

පින්වතුනේ, පින්වත් දරුවනේ,

අපට වුනත් යහපත් දෙයක් කරන්න ගියවිට මොනතරම් අපහසුතා දුෂ්කරතා වෙනවාද. අපිත් ඒ වෙලාවට සිත කලබල නොකරගෙන ඉන්ට ඕනා. සිත නරක් නොකරගෙන ඉන්ට ඕනා. ඉවසීමෙන් ඉන්ට ඕනා. එතකොට නැවත අපට ඒ යහපත් දේ කරගන්න අවස්ථාව ලැබේවි. ධර්මයේ හැසිරීම එහෙම දෙයක් නේද.



# ජීවිතය
# දහමින් රැකගනිමු...

දයාබර දුවේ පුතේ,

2019 අවුරුද්ද ගෙවී ගියා. දැන්... 2020 අවුරුද්දත් අවසන් වන්නට ළඟයි. ඔබට මතක ද 2019 ගැන? ඔබේ පාසල් අධ්‍යයන වාර තුනෙන් දෙවැන්න නොසිතූ ආකාරයෙන් බොහෝම කෙටි වුණා නේ ද? අන්තවාදී මූලධර්මවාදීන්ගේ කුරිරු බෝම්බ ප්‍රහාරයන් හමුවේ මුළු රටම අනාරක්ෂිත භාවයේ පවතිද්දී පාසල් සියල්ල වසා දැමුණු නිසා ඔබේ අධ්‍යයන වාරයේ වැඩි කොටසක් නිවෙස්වලට සීමා කෙරුණා. 2020 ව්‍යවහාරික වර්ෂය උදා වෙද්දී අපි කවුරුවත් හිතුවේ නැහැ අපි හැමෝගෙම සාමාන්‍ය ජීවිත ව්‍යාකූල වන ආකාරයේ අවදානමකට පත් වේවි කියලා. ඒත්... සිද්ධ වුණේ ඒ දෙයම යි. කොවිඩ් 19 රෝගී තත්ත්වය වසංගතයක් බවට පත් වෙලා මුළු ලෝකයේ ම බිලියන ගණනක් වූ ශිෂ්‍ය පිරිසක් තම තමන්ගේ අධ්‍යාපන ආයතනවලින් බැහැර කරවලා නිවෙස් තුළ රඳවන්නට සමත් වුණා.

ඉතින්... 2019 වර්ෂයටත් වඩා වැඩි කාලයකින් ඔබේ පාසල් අධ්‍යයන කාල සීමාව ඔබට මේ අවුරුද්දේ අහිමි වෙලා. ඒ අතරෙ ම, වෙන කවදාටවත් වඩා ඔබට අන්තර්ජාල පහසුකම් භාවිත කරන්නට ලොකු නිදහසක් ලැබිලා. වෙනදාට නම් ඒ ගැන දැඩි සීමා පනවන - නීතිරීති දමන දෙමව්පියනුත් බොහොම උනන්දුවෙන් ඔබත් සමග ඒ කාර්යයට එක්කාසු වෙලා. අපි බොහෝ දෙනෙකුගේ ජීවිත රටාවන් බොහෝ සෙයින් ම වෙනස් කරන්නට 2020 සමත් වුණා කිව්වොත් එහි වරදක් නැහැ. ඉතින් ඔබත් ඒ වෙනසේ සාමාජිකයෙක් වෙමින් ඔන්ලයින් ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රමවේදයට අනුගත වුණා. තව කොතරම් කාලයක් ඒ මත යැපෙන්නට ලෝකයට සිදු වෙයි ද කියලා අපට අනාවැකි කියන්නට පුළුවන්කමක් නැහැ. සිදුවන සියල්ල අනපේක්ෂිතයි. මේ වන විට මිලියනනයකට අධික

මිනිස් ජීවිත ප්‍රමාණයක් මරුමුවට පත් කළ කොවිඩ් ව්‍යාධි බිය පහව යන දවසක් ගැන අපට අදහසක් නැහැ. එනිසා, අපේ ඉදිරි ජීවිත කාලය මේ සමග කෙරෙන ගනුදෙනුවක් බවට පත් වන්නටයි වැඩි ඉඩක් තිබෙන්නේ.

දයාබර දුවේ පුතේ, ඒ ආකාරයෙන් අපේ ජීවිත තුළ වෙනස් කළ නොහැකි, වැළැක්විය නොහැකි විපර්යාසයන් සිදු කෙරෙද්දි ඊට කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් හෝ අනුගත වීම ම යි අපට කරන්නට සිද්ධ වෙන්නේ. අද සිදු වනවා වගේ ම හෙට සිදු වන්නේත් ඒ දේ ම යි. හැබැයි... ඒ සියල්ල අතරේ අපේ ජීවිත කාලයත් බොහොම වේගයෙන් ගෙවී යන බව අප සිහි තබා ගත යුතුයි. රාත්‍රිය පහන් වෙන්නේ අපේ ආයුෂය ගෙවාගෙන. ඉක්මනට අපි වයසට යනවා. අපි ඉගෙන ගත්තත් නැතත්, අපි විභාගවලට ලිව්වත් නැතත්, අපි පාඩම් කළත් නැතත්, අපි ලෙඩ වුණත් නැතත් අපේ ජීවිත කාලය හැම මොහොතෙම ගෙවී යනවා කියන එකයි සත්‍යය. දුවේ පුතේ, කොවිඩ් නිසා පාසල් වැසුණා කියලා වයසට යන එක නවතින්නේ නැහැ...

හැම රැයක් ම ගෙවී යන්නේ ආයුෂය අඩු කරමින්. ඒ ගෙවී යන ජීවිත කාලය තුළ අප විසින් අප ව රැකගන්නට සමත් ධනයක් උපදවා ගත්තේ නැති නම් ඒක ලොකු අනතුරක්. තව කොච්චර කාලයක් ද ජීවත් වෙන්න තියෙන්නේ කියලා අපි කවුරුවත් දන්නේ නෑ. අප සරණ ගිය අපගේ ශාස්තෘන් වහන්සේ අවවාද කොට වදාළේ 'ඉහළට ගත්ත හුස්ම පොද පහළ හෙළන්න කලින් මම මැරෙන්න පුළුවන්' කියලා සිහි කරන්නට කියලයි. ඔව්... අපේ ජීවිතවල නිසැකව ම යම් මොහොතක් එළඹෙනවා ඉහළට ගත්ත හුස්ම පොද පහළ හෙළන්න කලින්, එහෙමත් නැති නම් පහළට හෙළපු හුස්ම පොද ඉහළට ඇද

ගන්න කලින් අපි මිය යන... කොවිඩ් වසංගතය හමුවේ ලක්ෂ ගණනින් මරුමුවට පත් වුණ හැම කෙනෙක් ම ඒ මොහොතට මුහුණ දුන්නා... අපටත් මොහොතක් එළඹෙනවා.

දුවේ පුතේ, බුද්ධ ශාසනයක් මුණගැහිලා පින් දහම් කරන්න ලැබුණ පින්වන්ත ජීවිතයක් ඔබ කාටත් තිබෙනවා. ඒ අවස්ථාව කෙනෙකුට අතිශයින් දුර්ලභව ලැබෙන අවස්ථාවක්. එයට කියන්නේ '**ක්ෂණ සම්පත්තිය**' කියල යි. දුර්ලභ මිනිස් ජීවිතයත්, සම්බුද්ධ ශාසනයත් එක්ව මුණගැසී දහමේ හැසිරෙන්න ලැබෙනවා. කල්ප සියයක් පුරා දෙව් මිනිස් ලෝකයාට හත් වරක් පමණයි ඒ පරම දුර්ලභ වාසනාව ලැබුණේ. සසරේ කළ පිනක මහිමයෙන් මේ ලද මිනිස් ජීවිතයේ අපට ඒ උත්තම වාසනා ගුණයත් ලැබුණා. ඒ නිසාවෙන් ම අප නිතර සිහිපත් කර ගත යුතුයි මේ ගෙවී යන්නේ හුදු ජීවිත කාලයක් නොවන බවත්, සම්බුද්ධ ශාසනයක වතපිළිවෙතින් පින්දහම් සිදු කර ගනිමින් සසර දුක් නිමා කරන්නට ලැබුණු අතිශයින් දුර්ලභ අවස්ථාව ද ඒ හා සමඟ ම ගෙවී යන බවත්...

කෝටි සංඛ්‍යාත ලෝක ජනගහනයක් මරණ බියට ඇද දමපු කොවිඩ් වසංගතය වැනි ව්‍යාධි දුක් අයිති වන්නේත් සසර දුකට යි. උපන් සත්වයා හට ලෙඩ දුක් ඇති වනවා යන්න සිදු වනවා. ඒවායින් ඇතැම් ලෙඩරෝග යම් යම් ප්‍රතිකර්ම යෙදීමෙන් සුවපත් කරන්නට පුළුවන් තමයි. එහෙත්... ලෙඩ වන ස්වභාවය කියා කියන්නේ සංසාරගත සත්වයන්ට සුව කළ නොහැකි දෙයක්. මැඬලිය නොහැකි දෙයක්. වයසට යාම, මරණය, ශෝක වැළපීම්, සුසුම් හෙළීම් ආදී සියල්ල අයිති ඒ සසර දුකට යි. 'ඉපදීමේ දුක' කියා යමක් ධර්මයේ පෙන්වා දෙනවා නම් ඒ තමයි මේ දුක් රැස...

දුවේ පුතේ, අද අප ඔබට යෝජනා කරන්නට සිතුවේ මේ පරම දුර්ලභ ක්ෂණ සම්පත්තියෙන් සමෘද්ධිමත් වුණ පින්වන්ත ජීවිතය අනතුරේ හෙළා ගන්නේ නැතිව කොවිඩ් වසංගතය හමුවේ ඇති වී තිබෙන 'වෙනස' එක්ක ගනුදෙනු කළ යුත්තේ කොහොමද කියන එක යි.

අන්තර්ජාලය කියන්නේ අප විසිනුත් භාවිත කරන්නක්. විශේෂයෙන් ම යම් යම් කරුණු කාරණා දැනකියා ගන්නට අන්තර්ජාල භාවිතය අපටත් උපකාරක වී තිබෙනවා. කොතරම් දැනුම් සම්භාරයක් ගොනු කොට තිබෙනවා වුණත්, කොතරම් පහසුවෙන් පරිශීලනය කළ හැකි වුණත්, කොතරම් ඉක්මනින් අපට වුවමනා දේවල් සොයා ගන්නට උදව් වනවා වුණත් අන්තර්ජාලය කියා කියන්නේ සම්පූර්ණයෙන් ම යහපත් දේවල් පමණක් ම එක්රැස් කෙරුණු තැනක් නම් නෙමෙයි... ඒ නිසයි අන්තර්ජාලය සමඟ ගනුදෙනු කරන්නට ඔබට වැඩි වැඩියෙන් අවස්ථාව ලැබෙනවා හා සමඟ ම ඔබව අනතුරේ වැටෙන්නට පළමු රැක ගන්නටයි අප මෙසේ කරුණු සිහිපත් කරන්නේ.

දුවේ පුතේ, මේ ලෝකයේ සත්‍යයත්, අසත්‍යයත් පවතිනවා. ධර්මයත් අධර්මයත් පවතිනවා. යහපත ඇති කරවන දේත්, අයහපත ඇති කරවන දේත් පවතිනවා. සත්‍යවාදී වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වදහළ උතුම් ශ්‍රී සද්ධර්මය පමණයි ලෝක සත්වයා හට සෑම ආකාරයකින් ම යහපත හිතසුව පිණිස පවතින්නේ. ඒ උතුම් ධර්මය ද විකෘති කොට ධර්මයේ නාමයෙන් අධර්මය පවසන අයත් ලෝකයේ සිටිනවා. අන්තර්ජාලය තුළ ඔබට ඒ සියලු කොට්ඨාසයන් මුණගැසෙනවා. ඒ විතරක් නෙමෙයි; ඒ සියල්ල අතරින් අති බහුතරයක් රාග, ද්වේෂ, මෝහ වැඩී යන්නට අනුබල දෙන

දේවල් ම යි. රාග, ද්වේෂ, මෝහ සහිත ව සිටින, ඒ අකුසල මූලයන්ගෙන් උපන් කෙලෙස් රෝගයන්ගෙන් රෝගී ව සිටින මිනිසුන් විසින් ඒ අකුසල් සහගත ස්වභාවය ම ඉස්මතු කරන දේවල් තමයි සමාජයට මුදා හරින්නේ. අසූචියට අසූචිය එකතු වෙනවා වගේ, දුගඳට දුගඳ එකතු වෙනවා වගේ අපේ සිත්වල නොනැසී පවතින අකුසල ස්වභාවයන් මේ දේවලට එක් වෙන්නෙ. හෙමින් නෙමෙයි; බොහොම වේගයෙන්...

දැන් ඔබට සිතෙන්නට පුළුවනි, අන්තර්ජාලයේ තිබෙන්නේ අකුසලය ඉස්මතු කරවන දේවල් ම විතරක් නොවෙන නිසා එහි අඩුවෙන් හෝ තිබෙන කුසලය උපදවන දේවල් එක්ක පමණක් එකතු වෙමින් වරදේ නොවැටී සිටින එක මහ දෙයක් නෙමෙයි කියලා. ඒත් දුවේ පුතේ, අපේ සසර පුරුදු මහා පුදුමාකාර විදිහටයි අපේ ජීවිත හසුරුවන්නේ. අප සසරට වැටුණේ බොහෝ කොට අකුසලය හා මුසු වීම නිසා මිසක් කුසලය හා මුසු වීම නිසා නෙමෙයි. සසර පුරා අපට පුරුදු රාග ද්වේෂ මෝහ තුළ ගෙවන ජීවිත යි. පරම දුර්ලභ බුද්ධ ශාසනය මුණගැසුණ පමණින් ඒ සසර පුරුදු අප හැර යන්නේ නැහැ. සිතාමතා වෙර වීරිය කිරීමෙනුයි ධර්මය තුළ පිහිටා මේ සිත අකුසලයෙන් මුදවා ගත යුත්තේ.

අපගේ ශාස්තෘන් වහන්සේ ජීවමාන වැඩ සිටි යුගයේ උන්වහන්සේ සමීපයේ කසාවත් දරාගෙන පැවිදි වුණ ඇතැම් උදවියට පවා අකුසලයට යට වීම වළකා ගන්නට බැරි වුණා. පිනැත්තන්ගේ, නුවණැත්තන්ගේ තෝතැන්න වූ ඒ යුගයෙන් වසර දෙදහස් පන්සියකටත් එහා සිටින අපට එය කොතරම් නම් දුෂ්කර වේවි ද?

ඒ ගැන නිතර සිතන්න. පසුගිය අවුරුද්දේ පාස්කු ප්‍රහාරය නිසාවෙන් වෙසක් පුන් පොහෝ දිනයට සිල් සමාදන් වීමට

විහාරස්ථානයකට යන්න අපට ඉඩ ලැබුණේ නෑ. ඉදිරියට මොනවා වේවි ද කියා කියන්නට අප කාටවත් බැහැ. ශාසනික පිළිවෙත්වලින් සිදු වන මේ දුරස් වීම බොහෝ දෙනෙකු තුළ කුසල් මගෙහි අලස බවක් ඇති කරවන්නට හේතු වෙනවා. එහෙත්... ඔබ එතැනට නම් වැටෙන්නට එපා. සෑම දවසක් ආරම්භයේ දී ම ඔබ ගෞරවයෙන්, ආදරයෙන් සිහිපත් කරන්න ඔබ **සම්මා සම්බුදුරජාණන් වහන්සේත්, ශ්‍රී සද්ධර්මයත්, ආර්ය මහා ශ්‍රාවක සංඝරත්නයත් සරණ ගිය බව.** දවස පුරා ඒ **සරණ සීලය** ගෞරවයෙන් රැක ගන්නවා කියා අධිෂ්ඨාන කර ගන්න. එසේ ආරම්භ කරන ලද දිනයේ ඔබ විසින් අන්තර්ජාලය සමඟ කරන ගනුදෙනුව නිවසේ වැඩිහිටියන් විසින් දක්නා විවෘත පරිසරයක සිදු කරන්නට වග බලා ගන්න. ඔබේ සෙවුමේ දර්ශන තිරය ඔබට නිබඳ රැකවරණය, උපකාරය සලසන දෙමාපිය වැඩිහිටියන් විසින් දකිනවා කියන්නේ ඔබට අනවශ්‍ය කරදරවල නොපැටලී සිටින්නට ආරක්ෂිත පරිසරයක් නිවසේ ගොඩනැගෙනවා කියන එක යි.

සිත ඇද බැඳ ගන්නා ආකර්ෂණීය තේමා ඔස්සේ කාලය කා දමන්නේ නැතිව මේ දුර්ලභ මිනිස් ජීවිතය ධර්මය තුළ දියුණු කරන එක පහසු නෑ. එනිසා, එවැනි ආකර්ෂණීය විච්චූරණ බහුල අන්තර්ජාලය එක්ක රහස් ගනුදෙනු තබා ගන්නට එපා. කිසිවෙකුටත් නොපෙනී, නොදැනී නින්ද සහගත නිස්සාර දේවල් එක්ක අන්තර්ජාලයේ සැරිසරන්නට ඔබට බැරි නැහැ තමයි. නමුත්, ධර්මයත් - කර්මයත් ලෝකයේ පවතිනවා. ඒවායෙන් වසන් කළ හැකි කිසිවක් ලෝකයේ නැහැ. එනිසා, ධර්මයෙන් ගැරහුම් නොලබන - කර්මයෙන් දුක්පීඩා නොවිඳින සත්පුරුෂ දරුවෙක් වෙන්නට ඔබ බලවත් ව අදිටන් කර ගන්න. ඒ වෙනුවෙන් උත්සාහවත් වෙන්න.

'ටික වෙලාවයිනේ', 'මට ඕන වෙලාවක හැදෙන්න පුළුවනි', 'මේ දේවල් ටිකක් බැලුවට නරකක් වෙනව ද?' වැනි මතිමතාන්තර ඔස්සේ සිත ඔබව ඒ දේවලට ම ඇද ගනීවි. එහෙම සිත මවා දෙන දේවල් ඔබ විශ්වාස කළොත් ඔබ සිතනවාට වඩා බොහොම ඉක්මණින් ඔබට මේ සියලු යහපත් දේ අහිමි වන්නටයි වැඩිම ඉඩක් තිබෙන්නේ. ඒ නිසා, නපුරු සර්පයෙක් දුටුවා වගේ එයට බිය වෙන්න...

කම්මැලි නොවී, අතපසු නොකොට හොඳින් ඉගෙන ගන්න. අප්‍රමාදී ව කුසල් දහම් දියුණු කරන්න. විපත් හමුවේ වේගයෙන් ගෙවී යන ආයුෂ කාලය අකුසලයෙන් වනසා නොගෙන, ගුණදහම් දියුණු කරමින් ධර්මය පුරුදු කරන සත්පුරුෂ දරුවෙකු ම වන්නට ඔබට තෙරුවනේ ආශීර්වාදය හිමි වේවා!

තෙරුවන් සරණයි..!

# නිර්මාණ ඉසව්

පැදියෙන් සිතුවමින් නිසඳැ
සුසැදි ඔබේ නිර්මාණ එකෘ







10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන නර්මදා භාරතී දියණිය
විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අයි.ජී. හසන්දී දහම්සා විසින් එවූ නිර්මාණයක්...



12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන පී.ඩී. පවනි හෂින්තා දියණිය විසින් එවූ නිර්මාණයක්...



12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුපුනි සංදීපනී දියණිය විසින් එවූ නිර්මාණයක්...



2020 අ.පො.ස. (උ/පෙළ) හැදෑරූ සිතුමි භාග්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්...




11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එන්.ජී. කාවින්දයා චමෝදි දියණිය විසින් එවූ නිර්මාණයක්...





07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩබ්.එම්. චතුත්තරා කාවින්දයා දියණිය විසින් එවූ නිර්මාණයක්...




08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන රවිඳු හර්ෂණ පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බී.එම්.ඩබ්. තිළිණි නිමාෂා දියණිය විසින් එවූ නිර්මාණයක්...



06 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බී.එම්. චතුනි දිනාරා දියණිය විසින් එවූ නිර්මාණයක්...




ශ්‍රද්ධා අධ්‍යාපන ශිෂ්‍යත්වලාභී දරුවෙකු විසින් එවූ නිර්මාණයක්...




10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන නර්මදා භාරතී දියණිය විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ආර්.එච්. පමුදි අකේෂණී
දියණිය විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බී තුවීෂා සෙනේෂි
දියණිය විසින් එවූ නිර්මාණයක්...




2020 අ.පො.ස. (උ/පෙළ) හැදෑරූ ඉමේෂා ජයමාලි
දියණිය විසින් එවූ නිර්මාණයක්...



08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ.එම්. කාවින්දයා සෙව්වන්දි
දියණිය විසින් එවූ නිර්මාණයක්...



07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ජනිත් ගිම්හාන විමුක්ති පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...




07 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ජනිත් ගිම්හාන විමුක්ති පුතණුවන් විසින් එවූ නිර්මාණයක්...



06 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන බී.එම්. චතුනි දිනාරා දියණිය විසින් එවූ නිර්මාණයක්...



10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන තක්ෂිලා සඳුනි
දියණිය විසින් එවූ නිර්මාණයක්...




10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඊ.කේ. නවීෂා නිර්මාණි
දියණිය විසින් එවූ නිර්මාණයක්...




2019 අ.පො.ස. (සා/පෙළ) හැදෑරූ එල්.ඒ. හසන්ති
කෞෂල්‍යා දියණිය විසින් එවූ නිර්මාණයක්...

## කොරෝනා වසංගතය....

පාසල වෙත තුටින් අපි යන අතරතුර
ආවා කොරෝනාවක් ඇඟ සලිත කර
විනෝදයට යන්නට සිටි දනුම් සර
චාරිකාව මඟ හැරුණේ දුකින් බර

විභාග නොමැතිව පාසල මඟ හැරුණා
දවස් සති මාස ගත වී කල් ගෙවුණා
යහළු යෙහළියන් කෙළි දෙළෙනුත් මිදුණා
ආදරණීය ගුරුභවතුන් දුරස් වුණා

නිතරම අත් මුව සෝදන්න උපදෙස් එල කරනා
ගුවන්විදුලියෙන් ටෙලිෆෝනයෙනුත් ඇසුණා
පිටරැටියන් "Covid" නිසා මිය ඇදෙණා
දහස් ගණන් දැක ගත සිත සලිත වුණා

"Safe" යන වදන සවනඟ රැඳුණු සර
පාඩම් ගොඩ වුණා දුරකථනයෙ නිතර
"මීටරයක දුරක්" සමඟින් මුව ආවරණ කර
යන්නට බැරි වුණා මගෙ පාසල වෙත අමර

අම්මා බනියි දුරකථනය ගැන කියලා
හොඳත් නරක දෙක ම ඇත එහි ගොඩ වීලා
පාසල් ළමුන් හට මෙය නරකයි කියලා
ඇය මා සමඟ උන්නා ගෙයි වැඩ ගොඩ ගැහිලා

ආ මඟ කෙටියි යාමට ඇත තව බොහෝ දුර
Covid එපා පළකන්නට අපේ මඟ
ඔබ හින්දා ඉතිරි උනේ අප අත ෆෝන් එක
දළඳා සමිඳු සරණයි පාසල් ළමුන් හට...!

09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඩී. ජාන්වි රෝචනා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

මඩ යට ඉපිද මඩ තැවරුණු
කැකුළු පියුම්....
පිරිසිදු දියෙන් නැහැවී දිය
මතට අවුත්...
වැජඹෙන අයුරු දුටුව ද සති
අරුණෝදෙන්...
ඔබත් වන්න බාධක මැඩ
පිපිණු පියුම්...

මව්පිය වෙහෙස කැප වන්නේ
නුඹ නමට...
සැමගේ පැතුම නුඹ ඉහළට
ඉගෙනුම ය....
සිව් මව්පියන් නුඹ දිවියට
බල කණුය...
වෙහෙසී ඉගෙන නුඹ දිවිය ම
ජය ගන්න...

"ශ්‍රද්ධා" නිබඳ ඔබ හට ශක්තිය
වන්නේ....
යහපත් සිතින් නිබඳව මඟ
පෙන්වන්නේ....
ඉගෙණුම පමණි දිවියේ දියුණුව
වන්නේ....
දිවියේ දිනුම ලබනුව නුඹ
සතුටින්නේ....

2020 අ.පො.ස. (උ/පෙළ) හාදාරණු ලබන ඩී. උත්පලා හිමාෂි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## පින්බර වෙසඟ.....

තුන් ලොව සනසන්නට තිර අදිටනින් මනා
පින්බර සිතිවිල්ල හද තුළ නිධන් වුණා
දන් දී තම ගතින් ලේ මස ඉස් ද වුණා
ළං විය බුදු බවට මහ බෝසතුන් තුමා

සිදුහත් කුමරු මහමායාවගේ කුසින්
දුටුවා එළිය ලුම්බිණි සල් උයන් මැදින්
තැබුවේ සනසමින් පා පොඩි පියුම් මතින්
නැගුවේ සිහ නදයි ලොව මුදවමී දුකින්

වැඩි විය පැමිණ ගිහි ගෙය ගැන කළකිරුණා
බුදු බව මිසක නැත අන් කිසිවෙක වරුණා
දුක් විඳ සය වසක් බුදු පදවිය ලැබුණා
සත් සිය සිය ගණන් උස් නිවනට හැරුණා

සුවා සුවහසක් ධර්මය දෙසා මුවින්
හොවා දම් තොටිල්ලේ මනුසතා සුවෙන්
නිවා තුන් ලොවක් පිරිනිවනට වැඩියෙන්
ගෙවා බව කතර සැනසෙණු නිවනින්

උතුම් තෙමඟුලෙන් පින්බර වූ වෙසගේ
දුක් සත මිදෙන දම් රුවනින් ඉතිරේ
සිතින් සිත පවා මෙත් සිතිවිලි පැතිරේ
නිවන් මඟ දණන් සිල් සුවඳින් ඇතිරේ

විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන ඉෂාරා සඳරුවනි වෙල්ලප්පිල
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## චිරත් කාලයක් වැජඹෙනු...

"අඳුරු දිවියට මිණි කිරණක් වී....
මාගේ දිවියට රුවලක් සේ....
ඔබ එක් වෙයි
නැණ ගුණදම් පිරි මිනිසෙකු බිහි කරනට....
වෙහෙසෙන මාගේ මව්නි, පියාණෙනි,
සදා ණයගැතී ඔබගේ පා යුග වඳිමී
මා දොහොත් මුදුන් දී...."

"ලොවොම බබළවන තරුවක් සේ....
අනාගතය එළිය කරන්නට
ඔබ මා හට දෙන අත්වැළ
කවදා හෝ අමතක නොවෙයි නිති....
ගුණ නුවණට මංපෙත් විවර කරණා ඔබ....
චිරත් කාලයක් වැජඹෙනු මැනවි!"

12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සචිනි සඳරේඛා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## මා පිය....

අතු පතර
විහිදී ගිය
මහා නුග වෘක්ෂයක්...

ගිනියම් ඉරේ රශ්මිය
පෙරා හරී සීරුවෙන්....
සෙවණ සදන
බෝසත්....
මිනිසත්කමත්...

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුබෝධා
මදුමාලි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## ජීවිතය....

සායම් කර
නේක වර්ණයෙන්...
සරසා සළුපිළි
නහවා
සුවඳ විලයුන්
රඟති
වේදිකාවක
නළු නිළියෝ
හති වැටන තරුම්..

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුබෝධා
මදුමාලි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## කොරෝනාව...

අතීතයේ මහ වසංගත පැමිණුනද,
ලොවක් සැනසූ අප බුදු හිමි
ඒ වසංගත ද සැනසුවේ....
හෙද, වෙද, ආරක්ෂක වැනි වර්තමාන දෙවියන්
රුදුරු සටනක යෙදෙන අතර ම,
කොරෝනා,
නුඹට නොපෙනුනිද ලක්මෑණි දරුවන් රකිනා රඟේ

අනේ බුදු හිමි අද වැඩ සිටියානම්,
රතන සූත්‍රයෙනි ඔබ දමන්නේ...
අභිවාතක වැනි මහ වසංගත මෙන්
එහෙනම්, ඔබත් නිහඬය අද දිනේ...

බුදු හිමිගේ පා පහස ලක්වේ
සුපින්බර වූ ලක්දිවේ
තවත් වැඩිකල් නොගොස් ඔබ හට
යන්නට වේමය තුරන් වී...

කෙසේ නමුදු, ඔබ තබා ඇත පාඩමක් අපහට,
සමඟිය යි ලොව තුන් කල් හි පැවතුනේ,
එය ම පමණක් තබා අප වෙත,
යන්නට යනු මැන කොරෝනා උවඳුරේ....

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන කේ. හෂිනිකා ගයන්ති
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## ආදරණීය අම්මා....

වීදියෙ කොනක ඉඳගෙන වටපිට බලනා
පිනිබර මුහුණ දෙකොණෙන් ඩා බිඳු හැළුණා
සුසුමක් හෙලන හඬ නෑ කිසිවෙකු අසනා
කඳුලැලි තනි රකියි ඇගෙ දෙනෙතින් ගලනා

රස බර පිරුළු සමඟින් රස කතා කියූ
රතු ලේ දහර කිරි කර මට රසට පෙවූ
මිහිමත නිවහනේ බුදු යැයි බුදුන් දෙසූ
හඳුනන්නේ නැති ද දරුවන් ගුණෙන් මවූ

දරු මුනුබුරන් ළඟ අඟහිඟ කම් නැතිනම්
මංමාවත් වලින් මව්පියො හිස් වේනම්
මිහිකත හඬන හඬ සවනට වැටෙනවනම්
දරුවන් කෙදින ඒදෝ මව්ගුණ හඳු නම්

අඳුරට මුවා වී මහ මග තනිවී
සීතල වැසි දියට ඇගෙ වත තෙතබරවී
කීමට කොතෙක් දේ ඇතුවත් හද ගොළුවී
මව්ගුණ නොදනුණොත් යයි ලොව කම්පාවී

මිත්තනියක් වී දරු මුනුබුරන් ළඟ
ඉන්නට සිතා උන් ඇය දිවි ගමන මග
අතපය වාරුනැති වන විට දිවියෙ අග
නවතින්නට වුණේ මාවත් අතර මග

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන දහරා දේශානි
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## බුදු සමිඳුනි....

දිනයකි එදා ලෝ සතහට සුවය ගෙනා
මුළු දඹදිව ම සළු මලින් ම සුවඳ වුණා
සියොතුන්ගේ ගී නද තව මිහිරි වුණා
බුදු සමිඳුණේ ඔබ මෙලොවට වැඩම කළා

ශිල්ප සතර සියලු කලාවන්ගෙ රණශූරයා
එහෙත් ඊට වැඩියෙන් ගුණ දම් පිරි රජ කුමාරයා
සතර පෙර නිමිති දැක ඔහු හද සසල වුණා
පැවිදි මගේ යන්නට ඔහු කැමති වුණා

මුල් කාලයේ දුෂ්කර මඟ යන්න වුණා
එහෙත් ඔහු ම නිවැරදි මඟ සොයා ගියා
ඔහු ඥානයෙන් බුදු වන බැව් තේරුම් ගත්තා
වෙසක් සඳේ අප හිමි බුදු බව ලැබුවා

දුක් කරදරවලින් ලෝ සත මුදවාලා
අමා දහම් ගඟුලෙන් මුළු ලොව නහවා
නිවනට යන මඟ සත හට පෙන්වාලා
සසර කතර එතෙර වන්න මඟ පාදා

ආයු කාලයේ අවසන උදා වුණා
මුළු ලෝ සත ම දුක් සයුරේ ගිල් වූවා
යළිත් බුදු රැසින් මුළු ලොව නැහැ වූවා
වෙසක් මහේ අප හිමි ලොව අතැර ගියා

මුළු ලෝසතට ගෙන දුන් මේ ආදර්ශේ
කිමදෝ දැන් එය පිළිගන්නේ නැත්තේ
සසරෙන් එතෙර වන්නට මඟ තිබෙද්දී
කිමද මිනිසුනේ තවමත් මනුලෝකේ

09 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඒ.එම්. සෂිනි අමා කරුණාරත්න දියණිය විසින් එවූ නිර්මාණයක්....

## ඔබ....

ඔබම වන්න
ස්වභාවික වන්න
එය වෙනත් අයෙකු
වනවාට වඩා පහසුයි...

රෝස මල යනු රෝස මලයි
කටරොලු මල යනු
කටරොලු මලයි
කටරොලු මලට
රෝස මලක් විය නො හැක...
එහෙත් කටරොලු මලට
අංග සම්පූර්ණ කටරොලු
මලක් විය හැකිය....

ඔබගේ සිතිවිලි පිරිසිදු නම්
ඒවා ප්‍රකාශ කිරීමටත්
ක්‍රියාවට නැංවීමටත්
පහසුය...

චාම් බව සුන්දරය, ශ්‍රේෂ්ඨය
එ යසත්‍යට ද සමීපය

12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන එම්.ජී. යේෂානි ලකීෂා දියණිය විසින් එවූ නිර්මාණයක්....

වන පෙතෙක
තුරු මුදුනක සිසිළ නො විඳ,
තම රුව
තම සුවඳ නො දැන,
බිම වැටී පරව යනු
වෙනුවට...
මලසුනෙක
බුදු හිමිට පිදෙන
සුවඳැති
පුංචි මලක් වෙන්නට
ඇත්නම්...
අනේ කොතරම් සොඳුරු ද...
බුදු සමිඳුනි
මා හදවත
ඔබට පිදෙන
කුසුමක් වේවා...!

13 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන .ජී.ජී. චාමිණී තරනි දියණිය විසින් එවූ නිර්මාණයක්....

## මතින් තොර රටකට පියනගමු... .

මත්ද්‍රව්‍ය නැමැති සමාජයේ මුල් සිඳගෙන ඇති
රකුසාගෙන් අත්මිදී සමාජයේ බබළන්නා
මඬෙහි මතුව ඉහළට විත් සුවඳ හමන
අරවින්දයක් බව නිසැක ය...

මඬෙහි මතවන පුංචි කැකුළට
දිවිය රැකගෙන ලොව නඟන්නට
සවිය දෙමු එක්වෙලා
මතින් තොර ලොවකට පියවර නඟා

සිප්හලේ ශිල්පය හදාරා
මතු දිවිය දිනන්නට වෙර දරණ
පුංචි පුතුහට පුංචි දූ හට
මේ ලොවෙහි අසිරිය පමණක්
නෙත ගටමු අපි එක්වෙලා....

මතින් තොර රටකට
අඩිතාලම දමමු අපි රොක් වෙලා....

10 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ජේ.පී. දිලාංජනී උමේෂිකා
දියණිය විසින් එවූ නිර්මාණයක්....

ජීවිතයේ වටිනාම වස්තුව වන
අධ්‍යාපනය සිදු කිරීමට
ආශාවක් තිබුණත්
වත්කමක් නැති මා හට
අත්වැලක් දී සැම දින
කරන මේ ආධාරය
පිළිගනිමි තුති දෙමින් සැම දින
ඔබ කරනා මෙම උපකාරයට

මමත් දෙමි පොඩි ත්‍යාගයක්
ත්‍යාගය තුළ පිං ඇත
අනුමෝදන් කරමි....
එය ඔබ හට...!

08 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන
ආර්.එම්. විබෝධා රාජපක්ෂ
දියණිය විසින් එවූ නිර්මාණයක්....

## දකින මිහිර... නො දකින අමිහිර...

මඟ සිටිනා මිනිසෙකු දැක කොමල
ඔහු අත තිබුණි අඹ එල බබළ
බුදිමින් සිටි නිසා රස කරමින් දඟල
මටත් බුදින්නට සිතුනයි යනෙන කල

අතට ගතිමි මියුරා එල රසැති ඉතා
කටට ගතිමි එය අති රසැයි සිතා
දිවට දැනුණි එහි රස කදිම එදා
දැනුණයි මම කෑවේ ඇඹුලඹයි කියා

සිතුවත් මිහිරියි කරන දේ සැමදෙනා
පෙනුණත් එලෙස නුවණින් බලනා
නොපෙනෙයි එලෙස කල නුවණින් දකිනා
නොසිතයි මිහිරියි කරන දේ සැමදෙනා

11 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිතුම් අරෝෂණ
පුතණුවන් විසින් එවූ නිර්මාණයක්....

## අරුත් තේරුම් ගනිමින් මිහිරට සජ්ඣායනා කරන්න

# මිත්තානිසංස සූත්‍රය

**පහූතභක්ඛෝ භවති - විප්පවුත්තෝ සකාසරා**
**බහූ නං උපජීවන්ති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
ගෙයින් පිට ගිය විට - බොහෝ සැළකිලි ලැබෙයි ඔහු හට
ඔහු නිසා බොහෝ දෙනෙක් - සුව සේ දිවි ගෙවත් ම ය

**යං යං ජනපදං යාති - නිගමේ රාජධානියෝ**
**සබ්බත්ථ පූජිතෝ හෝති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
යම් කිසි නුවරකට - වෙනත් රටකට ගිය විට
හැම තැන දී ම ඔහු හට - පුද සත්කාර ලැබෙන්නේ ම ය

**නාස්ස චෝරා පසහන්ති - නාතිමඤ්ඤේති ඛත්තියෝ**
**සබ්බේ අමිත්තේ තරති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
සොර-සතුරෝ ද ඔහු හට - ළං නො වී සිටිත් ම ය
රජතුමා ඔහු ගැන - අවමනක් නො කෙරේ ම ය
ඔහු සියලු සතුරන් ගෙන් - ඈත් වී සිටින්නේ ම ය

**අක්කුද්ධෝ සඝරං ඒති - සභාය පටිනන්දිතෝ**
**ඤාතීනං උත්තමෝ හෝති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
කෝපයක් නැති සිතින් - එන්නේ ය තම නිවසට
සභා මැදකට ගිය විට - පිළිගන්නේ ය සතුටින්
නෑයන් වෙතට ගිය විට - ඔහු උතුම් නෑයෙක් ම ය

**සක්කත්වා සක්කතෝ හෝති - ගරු හෝති සගාරවෝ**
**වණ්ණකිත්තිභතෝ හෝති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
අනුන් හට සැළකිලි කොට - තමා සැළකිලි ලබන්නේ ම ය
අනුන් හට ගරු සරු කොට - තමා ගරු සරු ලබන්නේ ම ය
හොඳ නමත් පැහැපත් කමත් - දරා ගෙන සිටින්නේ ම ය

**පූජකෝ ලභතේ පූජං - වන්දකෝ පටිවන්දනං**
**යසෝ කිත්තිඤ්ච පප්පෝති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
පිදිය යුත්තන් පුදමින - තමා පිදවිලි ලබන්නේ ම ය
වැඳිය යුත්තන් වැඳ පුදා - තමා වැඳුමන් ලබන්නේ ම ය
පැතිරුණ කිත් යසස - ඔහු සොයා පැමිණේ ම ය

**අග්ගි යථා පජ්ජලති - දේවතාව විරෝචති**
**සිරියා අජහිතෝ හෝති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
ගිනි සිළුවක් ලෙසට - ඉසුරෙන් දිලෙන්නේ ම ය
දෙව් කෙනෙක් විලසට - ආනුභාව ලබන්නේ ම ය
සිරියාව හැම විට - ඔහු කෙරෙන් පහ නො වන්නේ ම ය

**ගාවෝ තස්ස පජායන්ති - ඛෙත්තේ වුත්තං විරූහති**
**පුත්තානං ඵලමස්නාති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
තමා ගේ ගව සම්පත - දියුණු වී යන්නේ ම ය
කුඹුරෙහි වගාව ද - සරුසාර වන්නේ ම ය
දූ දරුවන් ද ඔහු හට - සුවසේ සිටින්නේ ම ය

**දරිතෝ පබ්බතාතෝ වා - රුක්ඛාතෝ පතිතෝ නරෝ**
**චුතෝ පතිට්ඨං ලභති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
කන්දකින් බෑවුමකින් - ගහකින් ද වැටෙනා විට
ඔහු හට හැම විට ම - පිහිට සැලසෙන්නේ ම ය

**විරූළ්හමූලසන්තානං - නිග්‍රෝධමිව මාලුතෝ**
**අමිත්තා නප්පසහන්ති - යෝ මිත්තානං න දූභති**

යමෙක් මිතුරන් හට - ද්‍රෝහි නැතිනම් කිසි විට
වැඩී ගිය මුල් ඇති - අතුපතර විහිදා සිටි
මහ නුගයක් සුළඟින් - නො වැටී සිටින විලසින්
සතුරන්ට කිසිවිට - ඔහුව යට කළ නො හැක්කේම ය.

**සුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියේසු අසංවුතං**
**භෝජනම්හි අමත්තඤ්ඤුං - කුසීතං හීනවීරියං**
**තං වේ පසහති මාරෝ - වාතෝ රුක්ඛං’ව දුබ්බලං**

තමාව ඇවිස්සෙන විදිහට
අරමුණු ශුභ වශයෙන්ම බල බලා ඉන්ට ගියොත්,
ඇස් කණ් ආදී ඉන්ද්‍රියන් අසංවර කරගත්තොත්,
දන් වැළඳීමේ අර්ථය පවා දන්නෙ නැත්නම්,
ඔහු කුසීත වූ, හීන වීරිය ඇති කෙනෙක්.
ඔහු මාරයාට යටවෙන්නේ
මහා සුළඟකින් කඩාගෙන වැටෙන දුර්වල ගහක් වගේ.

**අසුභානුපස්සිං විහරන්තං - ඉන්ද්‍රියේසු සුසංවුතං**
**භෝජනම්හි ච මත්තඤ්ඤුං - සද්ධං ආරද්ධවීරියං**
**තං වේ නප්පසහති මාරෝ - වාතෝ සේලං’ව පබ්බතං**

රාගය දුරුවෙලා යන විදිහට
අශුභ දෙය අශුභ වශයෙන්ම දකිමින් ඉන්නවා නම්,
ඇස් කණ් ආදී ඉන්ද්‍රියන් සංවර කරගෙන නම්,
දන් වැළඳීමේ අර්ථය දන්නවා නම්, ඔහු ශ්‍රද්ධාවන්ත කෙනෙක්.
ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන,
පටන්ගත් වීරිය ඇති කෙනෙක්.
මාරයාට ඔහුව සොළවන්ටවත් බැහැ.
කොයි තරම් හුළං හැමුවත් සොළවන්නට බැරි ගල්
පර්වතයක් වගෙයි.

(කොසැඹෑ නුවරදී කළහකාරී භික්ෂූන් අරභයා වදාළ ගාථාවකි.)

©2018 All Rights Reserved. Shraddha Media Network. No : 369, Hewagama, Kaduwela.
T.P. 0112 571 471 | Fax : 0112 548 400 | Web : www.shraddha.lk | Email : edu@shraddha.lk
www.facebook.com/ShraddhaTV www.youtube.com/ShraddhaTV www.google.com/+ShraddhaTV www.twitter.com/ShraddhaTV